වස්ත්‍රය, අපට සැප පහසුව, උණුසුම, ආරක්ෂාව සහ පෙනුමද ලබා දෙන්නේය. එය නිසැකයෙන්ම බිරිඳ සහ සැමියා අතර පවතින සම්බන්ධතාවය බඳුය.

## විවාහ ජීවිතය තුළ ඇති ආදරය සහ කරුණාව

"ඔබ අතුරින් උතුම් අය වන්නේ, ඔබගේ බිරින්දෑවරුන්ට උසස් ලෙස සලකන්නන්ය"යැයි නබිතුමාණන් පැවසු වේ, ස්වාමියා විසින් තම බිරිඳට හොඳින් සැලකිය යුතුබව දිරිගැන්වීම සඳහාය.

> ඔබගේ බිරිඳන්
> ඔබට සිත සුව ලැබීම පිණිස
> ඔබගෙන්ම නිර්මාණය කර,
> ඔබ අතර ආදරය හා
> සෙනෙහස ඇති කර ඇත.
> නියත වශයෙන්ම මෙය
> මෙනෙහි කරන අයට මෙය
> හොඳ සළකුණකි.
> අල්-කුර් ආනය 30-21

දිනක් කෙනෙකු, නබිතුමාගේ බිරිඳක්වන අයිෂා තුමියගෙන් එතුමා නිවසේදී කෙසේ ක්‍රියාකරන්නේ දැයි විමසීය. එවිට "එතුමාණන්ද නිවසේදී ඔබලා වැනිය. බෙහෙවින් මෘදු, නිර්ලෝභී, ත්‍යාගශීලි පුද්ගලයෙකි,

නිවසේ එදිනෙදා සාමාන්‍ය වැඩ කටයුතු වලදී භාර්යාවන්ට නිතරම උදව් උපකාර කරමින් වස්ත්‍ර තමන්ම මසා ගත් අතර සපත්තු තමන් විසින්ම පිළිසකර කර ගන්නා ලදී යැයි ඇය පැවසුවාය. මෙයින් පැහැදිලි වන්නේ එතුමාණන් පොදුවේ නිවසේ සියළු කටයුතුවලදී සහාය ලබා දී ඇති බවයි.

## මවට සහ දියණියට ඇති උතුම් ස්ථානය.

මවට, තම දරුවා කෙරෙහි, විශේෂයෙන් කුඩා කළ ඇය ලබාදුන් අසීමිත ආදරය, කරුණාව, දයාව මගින් ඉතා විශාල බලපැවැත්මක් ඇත. නිසැකයෙන්ම සමාජයක සාර්ථකත්වය රඳා පවතින්නේ මව මතය. එබැවින් මවට ඉතා ගෞරවයෙන් යුතුව සහ උසස් කොට සැලකීම ඉස්ලාමය අවධාරණය කරයි.

දෙවියන්වහන්සේ මෙසේ පවසයි.

> අප මිනිසාට
> තම මවට යුතුකම් ඉටු
> කර කරුණාවන්ත වන
> ලෙස අණ කර ඇත. ඇය
> ඉතා අපහසුවෙන් ඔහුව
> උසුලා, ඉතාමත් අමාරු-
> වෙන් ප්‍රසූත කරන්නීය.
> අල්-කුර්ආනය 46 -15

දිනක් නබිතුමාණන් වෙත පැමිණි කෙනෙකු මෙසේ විමසීය. "දෙවියන්වහන්සේගේ දූතයාණෙනි මිනිසුන් අතුරින් මාගේ සැලකිල්ලට බඳුන් කළ යුත්තේ කාවද? " එවිට එතුමාණන්, "ඔබගේ මව" යැයි පිළිතුරු දුන්හ. මෙසේ දෙවරක්ම ඇසූ විට එකම පිළිතුර දුන්හ. ඉන්පසු කාවදැයි සිව්වන වරට ඇසූ කළ "ඔබගේ පියා" යැයි එතුමාණන් පිළිතුරු දුන්හ.

v1.01

ඉස්ලාමය යහපත් ප්‍රතිඵල ලබා දෙන බවට පොරොන්දුවී ඇත්තේ තමන්ගේ මවට ගරු බුහුමන් දැක්වූ අයට පමණක් නොවේ එම ආනිසංශය ගැහැණු දරුවන් හොඳින් හදා වඩා ගත් දෙමාපියන්ටත් හිමිවේ.

මුහම්මද් නබිතුමාණන් මෙසේ පැවසූහ. "කවුරුන් හෝ තමා හට දෙවියන්වහන්සේ ලබා දුන් ගැහැණු දරුවන් දෙදෙනාට කරුණාවෙන් සලකන්නේද, ඔහුට ස්වර්ගයට ඇතුල්වීමට එම දියණියන් දෙදෙනා හේතුවක් වනු ඇත"

## නිගමනය

ඉස්ලාමයට පෙර කාන්තාවන් සමාජයේ නින්දාවට බඳුන් වී තිබුණි. කුඩා ගැහැණු දරුවන් පණ පිටින් වළලනු ලැබූහ. ගණිකා වෘත්තිය බහුලව පැවතුණි. දික්කසාද බලය හිමි වී තිබුනේ පිරිමින්ට පමණි. දේපොළ උරුමය බලවතුන්ට පමණි. .කාන්තාවන්ට කරනු ලබන වද හිංසන අධික වශයෙන් පැතිරී තිබුණි. ඉස්ලාමය පැමිණීමත් සමග මෙවැනි ක්‍රියාවන් සම්පූර්ණයෙන්ම තුරන් විය. නමුත් සමහර දියුණු රටවල්වල දැනුදු කාන්තාවන්ට හිමිවිය යුතු ගෞරවය ලබා දී නැත. කෙසේ වෙතත් කාන්තාව යනු මාහැඟි වටිනා එමෙන්ම නින්දාවට බඳුන් නොවී ගෞරවයට පාත්‍ර විය යුතු කෙනෙකු බව ඉස්ලාමය සලකයි. ඇතැම් රටවල්වල හා මුස්ලිම් පවුල්වල සිදුවන කාන්තා අසාධාරණ කම්වලට ඉස්ලාමය සාදක නොවන අතර එය ඔවුන් පිළිපදින වැරදි සංස්කෘතිකයන් නිසා සිදුවන්නෙකි. ඉස්ලාමය කාන්තාවන්හට පීඩාවක් ගෙනදෙන ආගමක් නම් ලොවේ බොහෝ කාන්තාවන් ඉස්ලාමය වැළඳ ගැනීමට කැමැත්තක් දක්වන්නේ මන්දැයි ප්‍රශ්නාර්ථයකි.

සියළු ජීවීන්ගේ අධිපතියාවූද, නිර්මාතෘවූද, ආරක්ෂකයාවූද, දෙවියන්වහන්සේ මෙසේ පවසයි.

> "ඇත්තෙන්ම, ධර්මයට කැප වූ පිරිමින්ටද ගැහැණුන්ටද, දේවවිශ්වාසය තැබූ පිරිමින්ටද ගැහැණුන්ටද, තම දෙවියන්ට අවනතවූ පිරිමින්ටද ගැහැණුන්ටද, ඉවසිලිවන්ත පිරිමින්ද ගැහැණුන්ටද, සත්‍යවන්ත වූ පිරිමින්ටද ගැහැණුන්ටද, දෙවියන්ට බිය බැතිවූ පිරිමින්ටද ගැහැණුන්ටද...... යනාදී පිරිසට දෙවියන්වහන්සේ සමාවද උතුම්වූ ප්‍රතිඵලයන් පිළියෙළ කර ඇත.
>
> අල්-කුර්ආනය 33-35.

More Information

p (+61) 3 9354-7500 w iisna.com/pamphlets e shareislam@gmail.com

Donation De tail s (Every $1 AUD donated produces 15 pamphlets)

Bank Name Commonwe alth Bank Account Pamphlet Project Australia
BSB 063620 Account 10532332 Swift (international) CTBAAU2S

# ඉස්ලාමය තුළ කාන්තා අයිතිවාසිකම්




learn the basics

www.iisna.com/pamphlets

ඉස්ලාමීය කාන්තාව පිළිබඳව පවසද්දී බොහෝ අයට හැඟී යන්නේ ඇය කාගේ හෝ පාලනයට යටත්වී සිටින, අවමාන ලබන සහ හිංසා පීඩාවලට ලක්වන තැනැත්තියක් ලෙසයි. සැබවින්ම එය සත්‍යක්ද? ලොව වසන මිලියන සංඛ්‍යාත මුස්ලිම් ජනයා කාන්තාවන් පීඩනයට පත් කරන දුෂ්ඨයන් විය හැකිද? එසේත් නැතිනම් මෙය එක්තරා පක්ෂග්‍රාහී මාධ්‍යයන් විසින් ගොතන ලද මිත්‍යා සංකල්පයක්ද ?

> කාන්තාව කෙරෙහි පුරුෂයන්ට ඇති අයිතිවාසිකම් සේම පුරුෂයන් කෙරෙහි කාන්තාවන්ටද අයිතිවාසිකම් ඇත.
> අල් කුර්ආනය 2.228

කාන්තාවන්ට ලබාදුන් අයිතිවාසිකම් අද බටහිර කාන්තාවන් භුක්ති විඳින්නේ මේ මෑත භාගයේ සිටය. 1930 දශකයේදී ඇනී බෙසන්ට් මෙසේ පවසන ලදී. එංගලන්තයේ ක්‍රිස්තියානිවරුන් කාන්තාවන් සඳහා දේපළ උරුමයන්හි අයිතිවාසිකම් හඳුනා ගත්තේ අවුරුදු 20ක් තරම් මෑත භාගයේදීය. නමුත් ඉස්ලාම් ධර්මය තුළ එය පහළ වූ කාලයේ පටන් කාන්තාවන්ට අයිතිවාසිකම් ලබා දී තිබේ. සමහරුන් ඉස්ලාමීය කාන්තාවන්හට කිසිදු ජීවයක් නැතැයි පැවසීම ඉතාමත් අපහාසයකි.

(The Life and Teachings of Mohammed, 1932).

කාන්තාව සහ පිරිමියා යන දෙදෙනාම ආදම් නබි තුමාගෙන් පැවතෙන්නන්ය. එබැවින් ඉස්ලාම් ධර්මය මේ දෙපිරිසගෙන්ම බලාපොරොත්තු වන්නේ යහපත්චර්යාව සහ යුක්තිගරුකත්වයයි.

## එක සමාන ආනිසංස සහ වගකීම්

පිරිමින් හා කාන්තාවන් යන දෙපාර්ෂවයම එකම දෙවියන්වහන්සේව (අල්ලාහ්) නමදින අතර නමදින වත් පිළිවෙත පෙදු වේ. එකම ධර්ම ග්‍රන්ථයන් අනුගමනය කරන අතර දරන්නේ එකම විශ්වාසයන්වේ. (අල්ලාහ් යනු සියලු නිර්මාණයන්හි එකම සත්‍ය දෙවියන් යන්නට යොදන අරාබි වචනයයි) දෙවියන්වහන්සේ, සියළු මනුෂ්‍යයින් අතරේ සර්ව සාධාරණව හා එක සමානව විනිශ්චය කරයි. දෙවියන්වහන්සේ තම කුර්ආනයේ බොහෝ ස්ථානවල පිරිමින්ට හා ගැහැණුන්ට කිසි භේදයකින් තොරව සාධාරණව සැලකිලි හා නියමිත ඵළවිපාක ලබා දෙන බව අවධාරණය කර සිටි

> දේව විශ්වාසවන්තයින්ගෙන් වූ පිරිමින්ටද ගැහැනුන්ටද යටින් ගලා බසිනා දිය දහරා වලින් පිරි ස්වර්ගය ලබා දෙන බවට පොරොන්දු වී ඇත. ඔව්හු එහි සදාකාලිකව වාසය කරනු ඇත. අලංකාරවත් මාලිගාවන්ද එසේම සියල්ලටම වඩා ඔවුන් දෙවියන්වහන්සේගේ ප්‍රසාදය භුක්ති විඳිනු ඇත. විශිෂ්ඨතම ජයග්‍රහණයද එය වේ.
> අල්-කුර් ආනය 9.72

> ස්ත්‍රීන් හෝ පුරුෂ හෝ වේවා ඔබලා අතරින් කවර ශ්‍රමිකයෙකුගේ වුවද ශ්‍රමය අපතේ යාමට මම ඉඩ නොදෙමි.
> අල්-කුර්ආනය 3.195

මින් අදහස් වන්නේ යම් කෙනෙකුට දෙවියන්වහන්සේගේ විනිෂ්චය ලැබීමට හා යහපත් ප්‍රතිඵල ලබාගැනීමට ලිංග භේදය බල නොපාන බවයි.

අනෙකුත් ආගම් හා සසඳන කළ ඉස්ලාමය දෙපාර්ශවයටම සාධාරණීය අන්දමින් ලබා දී ඇති බව දැක ගත හැක. උදාහරණයක් වශයෙන් ගත් කළ තහනම් ගසේ ඵල අනුභව කිරීමේ හේතුවෙන් ආදම්ට වඩා එතුමාගේ බිරිඳ හව්වා හට චෝදනා එල්ල කිරීම ඉස්ලාමය තරයේ ප්‍රතික්ෂේප කරයි. දෙදෙනාම පව් කළ අතර ඒ සඳහා පව් සමාව දෙදෙනාම ඇයද සිටි බැවින් දෙවියන්වහන්සේ ඔවුන් දෙදෙනාටම සමාව දුන්නේය.

## අධ්‍යාපනය ලබා ගැනීම සඳහා සම අයිතිය

පිරිමි සහ කාන්තාවන් යන දෙපාර්ශවයටම අධ්‍යාපනය හැදෑරීමට ඉස්ලාමය සම සේ දිරිගන්වයි. "අධ්‍යාපනය සෑම මුස්ලිම් වරයෙකුටම අනිවාර්‍ය වේ" යයි නබි තුමාණන් පවසා ඇත.

එමෙන්ම නබිතුමාණන්ගේ අවධියේ පවා උගත් මුස්ලිම් කාන්තාවන් සිටියහ. සමහරුන් එතුමාණන්ගේ පවුලේ උදවිය වූ අතර සමහරුන් එතුමාණන්ගේ යහළු මිත්‍රාදීන් නැතහොත් ඔවුන්ගේ දියණියන් විය. ඔවුන් අතුරින් විශේෂ ස්ථානයක් හිමිවන්නේ නබිතුමාණන්ගේ බිරිඳක් වූ ආයිෂා තුමියටයි. එතුමිය ඉස්ලාමීය නීති සංග්‍රහයෙන් හතරෙන් පංගුවක් පමණ දැණුමක් ලැබු කෙනෙකි..

අනෙකුත් කාන්තාවන් නීතිවිද්‍යාවෙහි උගතුන් වූ අතර ඔවුන් යටතේ ඉගෙන ගෙන උගතුන් වූ පිරිමි ශිෂ්‍යයන්ද විය.

## තම ජීවන සහකරුවා තෝරා ගැනීමට ඇති සම අයිතිය

ඉස්ලාමය කාන්තාවන් හට තමන් කැමති පුද්ගලයාව විවාහ කරගැනීමේ අයිතියත් විවාහයෙන් පසු තමාගේ පවුලේ නම (වාසගම) තවදුරටත් පවත්වාගෙන යෑමේ අයිතියත් ගෞරවයෙන් යුතුව ඇයට ලබා දී ඇත. ඇතැමුන් සිතනුයේ තම මව්පියන්ගේ බලපෑම යටතේ තම දියණියන්ව විවාහ කර දෙන බවයි. එය (සමහර රටවල) පිළිපදින සංස්කෘතික ක්‍රියාවක් මිස ඉස්ලාමයේ තහනම් වූ ක්‍රියාවකි.

වරක් නබි මුහම්මද් තුමාණන්ගේ සමයෙදී එතුමාණන් වෙත පැමිණි කාන්තාවක් මෙසේ පැවසුවාය. "මාගේ පියාණන් ඔහුගේ සමාජ තත්වය ඉහළ නංවා ගැනීමේ අදහසින් මාව මාගේ ඥාති සහෝදරයකුට විවාහ කර දීමට බල කරන්නේය ". එවිට නබිතුමාණන් පණිවුඩකරුවෙකු යවා ඇයගේ පියාවද එම සභාවට ගෙන එනු ලැබ ඔහු ඉදිරියේ එම කාන්තාව හට විකල්පයන් ලෙස තවදුරට එම විවාහ යෝජනාවට කැමැත්ත පළකරනවාද නැතහොත් එය ප්‍රතික්ෂේප කරනවාදැයි යෝජනා කරන ලදී. එවිට ඇයගේ පිළිතුර වූයේ දෙවියන්වහන්සේගේ දූතයාණෙනි මම මාගේ පියාණන්ගේ යෝජනාවට කැමැත්ත පළ කරමි, නමුත් මට අවශ්‍යවන්නේ කාන්තාවන්ට තමාගේ විවාහය සඳහා කිසිදු බලපෑමකට යටත් නොවිය යුතු බව පෙන්වීමටයි.

## සමානතා මෙන්ම අසමානතා

කාන්තාවන් හා පිරිමින් හට පොදු සිද්ධාන්තයන් තුළදී සමාන අයිතිවාසිකම් ලබා දී තිබුණද, ඔවුන් දෙපළටම එකිනෙකාට විශේෂ වූ ඌනපුරක වූ අයිතිවාසිකම් සහ වගකීම් වෙන්වෙන්ව ලබාදී ඇත.

අභ්‍යන්තරව හා ශාරීරිකව ඇති වෙනස්කම් වලට අමතරව භාෂාව හැසිරවීමේදී, තොරතුරු ලබාගැනීමේදී සහ හැඟීම් අතර මොළයේ සිදුවන සියුම් වෙනස්කම් රාශියක් විද්‍යාඥයන්ගේ සොයාගැනීම් වලට බඳුන් වී ඇත.

හාවාර්ඩ් විශ්වවිද්‍යාලයේ සමාජ - ජීවවිද්‍යාව පිළිබඳව විශේෂඥයෙකු වන එඩ්වර්ඩ් ඕ. විල්සන් පවසන පරිදි කාන්තාව, පිරිමින්ට වඩා වාචික, සමාජීය මෙන්ම බැඳීරුම් අංශ පිළිබඳ නිපුණතාවයක් දක්වන අතර, ස්වාධීනව කටයුතු කිරීම, යමක ප්‍රධානත්වය දැරීම, ගණිතමය හා අභ්‍යවකාශ පිළිබඳ මනා දැනුම, නීතියානුකූලව යමක බලය තහවුරු කිරීමේ හැකියාව යනාදී ලක්ෂණ වලින් පිරිමියා කාන්තාව අභිබවා සිටින බවයි.

එකිනෙකාගේ වෙනස්කම් නොතකා එක සමානව සැලකීම එක්තරා අණුවන කමක් විය හැක. දෙපාර්ශවයටම එකිනෙකා අතර වෙනස්වූ ඌන පූර්වක සහ වෙනස් ක්‍රියාකලාපයන් ඇති බව ඉස්ලාමය පෙන්වා දෙයි.

> පිරිමි දරුවා ගැහැණු දරුවා මෙන් නොවන්නේය.
> අල්-කුර්ආනය 3-36

> සියල්ල නිර්මාණය කළ ඔහු සියළු දේ ගැන නොදන්නේද? ඔහු ඉතා දයාබරය, සියල්ල දන්නේය. .
> අල්-කුර්ආනය 67-14

## පවුල් ඒකකය

දෙවියන්වහනසේ, කාන්තාව සහ පිරිමියා අතර දක්ෂතා, ආවේනික චරිත ලක්ෂණ සහ විවිධ වූ වගකීම් වලින් වෙනස් ආකාරයට නිර්මාණය කර ඇත.. මෙම වෙනස්කම් එකිනෙකා අතර උස් පහත් භේදය පෙන්නුම් කිරීමට නොව, දෙදෙනාගේම විශේෂත්වයන් පෙන්නුම් කිරීම සඳහාය. ඉස්ලාමය තුළ පවුල් ඒකකයට වැදගත් කේන්ද්‍රීය ස්ථානයක් හිමි වන අතර. පවුලේ ආර්ථිකය සහ නඩත්තුව සඳහා පිරිමියා වගකිවයුතු අතර, පවුලේ සාමාජිකයන්ගේ අධ්‍යාපනය සහ කායික දියුණුව රඳා පවතින්නේ කාන්තාව මතය. පවුලේ සාමාජිකයන් අතර තරඟකාරීත්වයට වඩා සහයෝගයකින් කටයුතු කිරීමට එය උපකාරීවේ.. එකිනෙකාගේ අන්‍යෝන්‍ය වගකීම් නිසිලෙස ඉටු කරීම මගින් ශක්තිමත් පවුල් ජීවිතයක් ගොඩනගාගත හැකි අතර එමගින් ශක්තිමත් සමාජයක්ද නිර්මාණය වෙයි..

ස්ත්‍රියකට හෝ පුරුෂයාට හෝ එකිනෙකාගෙන් තොරව හැඟුම්බර, සතුටින් පිරි ජීවිතයක් ගත කළ නොහැකි බව දෙවියන්වහන්සේ ඉතාමත් අලංකාරවත් ලෙස අල්-කුර්ආනයෙහි සඳහන් කරයි.

> ඔවුන් ඔබට වස්ත්‍රයක් ලෙසද, ඔබ ඔවුන්ට වස්ත්‍රයක් ලෙසද සිටින්නේය.
> අල්-කුර්ආනය 2-187